## ඔබගේ මුඛයේ ඉහත සඳහන් ලක්ෂණ එකක් හෝ ඇත්නම් ...

- ළඟම ඇති
  - දන්ත වෛද්‍ය සායනයක් හෝ
  - සුව දිවි සායනයක් හෝ
  - බාහිර රෝගී අංශයක්

  වෙත යොමුවන්න.

- සැක සහිත වෙනස්වීමක් තිබේනම් ඔබව මුඛ හනුක හා වක්ත්‍ර විශේෂඥ ශල්‍ය වෛද්‍ය සායනයට යොමු කෙරෙනු ඇත.

- එම සායනය වලදී ලබාදෙන උපදෙස් හා ප්‍රතිකාර නිසිලෙස පිළිපදින්න.

**පූර්ව-මුඛ පිළිකා කලින් හඳුනාගෙන ඉක්මනින් නිවැරදි ප්‍රතිකාර ගතහොත් එම තත්ත්වයන් පිළිකාවක් දක්වා වර්ධනය වීම වළක්වා ගත හැකිය.**

## මුඛ පිළිකාවෙන් මිදීමට...

- මුඛ පිළිකා ඇතිවීමට හේතු වන අහිතකර පුරුදු වලින් වැළකෙන්න.



- ඔබගේ මුඛය ඔබම පරීක්ෂා කර ගන්න.

- ඔබගේ මුඛයේ ඉහත සඳහන් ලක්ෂණ එකක් හෝ ඇත්නම් වහාම දන්ත වෛද්‍ය හෝ වෛද්‍ය සායනයකට යොමුවන්න.

- ලබාදෙන වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නිසිලෙස පිළිපදින්න.

ජාතික පිළිකා මර්දන වැඩසටහන
සෞඛ්‍ය අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

555, ඇල්විටිගල මාවත , නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011 2368627, 011 3159227
Email: nccpsl@yahoo.com Web: www.nccp.health.gov.lk

# මුඛ පිළිකාවෙන් වැළකෙමු



## නිරෝගිමත් ජීවිතයක් ගතකරමු

## මුඛ පිළිකාව...

- ශ්‍රී ලංකාවේ බහුලතම පිළිකා අතර දෙවැනි තැන ගනී.
- පිරිමින් අතර බහුලතම පිළිකාවයි.

## ඔබ දන්නවාද?

- බුලත්විට සැපීම, දුම්කොළ/පුවක් අඩංගු නිෂ්පාදන (පුවක් පැකට්) සැපීම, දුම් බීම, මත් වතුර බීම වැනි අහිතකර පුරුදුවලින් බැහැරවීමෙන් මුඛ පිළිකා ඇතිවීම වළක්වා ගත හැකි බව.
- බහුතරයක් මුඛ පිළිකා, කලින් හඳුනා ගත හැකි පූර්ව-මුඛ පිළිකා තත්ත්වයන් ගෙන් හටගන්නා බව.
- පූර්ව-මුඛ පිළිකා කලින් හඳුනාගෙන නිසි ප්‍රතිකාර ලබාගතහොත් එවැනි තත්ත්වයන් මුඛ පිළිකා දක්වා වර්ධනය වීම වළක්වා ගත හැකි බව.

## මුඛ පිළිකා කලින් හඳුනා ගැනීමට...

මසකට වරක්වත් ඔබගේ මුඛය ඔබම පරීක්ෂා කර ගන්න (ස්ව-මුඛ පරීක්ෂාව).



### එය කළ යුත්තේ කෙසේද?

- දැත් හොඳින් සෝදා පිරිසිදු කරගන්න.
- කෘතිම දත් ඇඳි ආදී උපකරණ පැළඳ සිටී නම් ඒවා ගලවන්න.
- මුඛය හොඳින් සෝදා පිරිසිදු කරගන්න
- කණ්නාඩියක් ඉදිරියට යන්න.
- මුඛයට හොඳින් ආලෝකය වැටෙන්නට සලස්වන්න.
- මුඛය විවෘත කර සෑම ස්ථානයක්ම පරීක්ෂා කරන්න.

1. උඩු සහ යටි තොල්



2. කම්මුල ඇතුලත දෙපැත්තම



3. දිව සෑම පැත්තක්ම



4. මුඛයේ පතුල



5. තල්ල



## පූර්ව-මුඛ පිළිකා ලක්ෂණ මොනවාද?

- වේදනාවෙන් තොර පිසදා ඉවත් කල නොහැකි සුදු, රතු හෝ සුදු හා රතු මිශ්‍ර ලප.



සුදු ලප



රතු ලප



සුදු හා රතු මිශ්‍ර ලප

- මිරිස් සහිත ආහාර ගන්නා විට නිතර ඇතිවන මුඛයේ දැවිල්ලක්.



- තොල් සහ මුඛ ශ්ලේෂ්මල පටලයේ අසාමාන්‍ය සුදුමැලි ස්වභාවය.
- ක්‍රමක්‍රමයෙන් ඇතිවන මුඛය විවෘත කිරීමට ඇති හැකියාව අඩුවීම.

